**10-01-2019 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, පියාට අයත් වී, පියාගේ නම කීර්තිමත් කරන්න. නම කීර්තිමත් වන්නේ ඔබ සම්පූර්ණයෙන්ම පිවිතුරු වූ විටයි. ඔබ සම්පූර්ණයෙන්ම මිහිරි ද විය යුතුයි.

**ප්‍රශ්නය:** ඔය දරුවන්ට ස්වර්ණමය යුගයේදී නොතිබෙන, සංගම යුගයේදී තිබෙන එක් කණස්සල්ල කුමක්ද?

**පිළිතුර:** සංගම යුගයේදී ඔබට පිවිතුරු වීමේ එක් කණස්සල්ල තිබේ. පියා ඔබව අන් සෑම කාරණාවකදීම සිතේ කරදර වලින් නිදහස් කර තිබේ. ඔබ උත්සාහ දරන්නේ සතුටින් ඔබගේ පැරණි ශරීර අත්හැර දැමීමට හැකි වීමටයි. ඔබ ඔය පැරණි ඇඳුම් ගලවා දමා, අලුත් ඒවා පැළඳ ගන්නා බව ඔබ දන්නවා. ඔය සෑම දරුවෙක්ම ඔබගේ හදවතින් විමසිය යුත්තේ, ඔබට කොපමණ සතුට තිබේද, එමෙන්ම ඔබ කොතරම් පියා සිහි කරනවාද කියාය.

ඕම් ශාන්ති. බොහෝ කාලයක් නැතිව සිට දැන් හමුවූ සුමිහිරි දරුවන්ට ආධ්‍යාත්මික පියා විස්තර කරනවා. ඔහු ඔවුන්ට විස්තර කර දී ඉගැන්වීම් ද ලබා දෙයි. ඔහු ඔබට නිර්මාණකරු සහ නිර්මාණයේ ආරම්භය, මැද සහ අවසානය පිළිබඳ රහස් කියා දෙයි. ඔහු මෙසේද කියයි සියලුම ගුණධර්ම වලින් පිරෙන්න, එමෙන්ම දිව්‍යමය ගුණධර්ම ධාරණය කරගන්න. ඔබ සිහිපත් කිරීමේ සිටීමෙන් සතෝප්‍රධාන් වෙයි. ලෝකය මෙකල තමෝප්‍රධාන් බව ඔබ දන්නවා. ලෝකය සතෝප්‍රධාන්ව තිබිණි, ඉන්පසුව වසර 5000කට පසුව එය දැන් තමෝප්‍රධාන් වී තිබේ. මෙය පැරණි ලෝකයකි. සෑම කෙනෙක් ගැනම මෙසේ කියැවෙයි මෙම කෙනා නව ලොවෙහි සිටියා. හෝ මෙම කෙනා සාම දේශයේ සිටියා. පියා මෙතැන අසුන් ගෙන විස්තර කරන්නේ ඔය ජීවයන්ටයි ඕ ආධ්‍යාත්මික දරුවනි, ඔබ අනිවාර්යෙන්ම සතෝප්‍රධාන් විය යුතුයි. ඔබ අනිවාර්යෙන්ම පියාගෙන් ඔබගේ උරුමය හිමි කර ගත යුතුයි. ඔබ අනිවාර්යෙන්ම මා වන ඔබගේ පියාව සිහි කළ යුතුයි. ලෞකික දරුවන් ද ඔවුන්ගේ පියාව සිහි කරයි. ඔවුන් වයසින් වැඩෙත්ම, සීමිත උරුමයකට අයිතියක් හිමි කර ගනී. ඔබ අසීමිත පියාගේ දරුවන්ය. ඔබ පියාගෙන් අසීමිත උරුමයක් හිමි කර ගත යුතුයි. දැන් භක්තිය ආදිය කිරීමට අවශ්‍ය නැත. මෙය විශ්ව විද්‍යාලයක් බව ඔය දරුවන්ට දැන ගන්නට ලැබී තිබේ. සියලුම මනුෂ්‍යයින් ඉගෙන ගත යුතුයි. ඔබ ඔබගේ බුද්ධිය අසීමිත කළ යුතුයි. මෙම පැරණි ලොවෙහි වෙනස් වීම දැන් අත ළඟයි. දැන් තමෝප්‍රධාන් අය, සතෝප්‍රධාන් වෙයි. මෙකල ඔබ අසීමිත පියාගෙන් ඔබගේ අසීමිත සතුටෙහි උරුමය හිමි කර ගන්නා බව ඔය දරුවන් දන්නවා. අපි දැන් එක් ආධ්‍යාත්මික පියාගේ උපදෙස් පිළිපැදිය යුතුයි. මෙම සිහිපත් කිරීමේ වන්දනාව තුළින් ඔය ජීව දැන් සතෝප්‍රධාන් වන අතර, ඉන්පසුව ඔබට සතෝප්‍රධාන් ලෝකයට යාමට සිදුවෙයි. ඔබ බ්‍රහ්මින්වරුන් බවත්, පියාට අයත්වන බවත් ඔබට වැටහෙනවා. ඔබ ඉගෙනගන්නා අතර, මෙම අධ්‍යයනයට ඥානය යැයි කියයි. භක්ති මාර්ගය වෙනස්ය. පියා මෙම ඥානය කියාදෙන්නේ ඔය බ්‍රහ්මණයින්ටයි. මෙම ඥානය ගැන වෙන කිසවෙකු නොදනී. ගුරුවරයා ද වන පියා, ඥානයේ සාගරය, උගන්වන්නේ කෙසේද කියාවත් ඔවුන් නොදනී. බාබා දිගින් දිගටම බොහෝ මාතෘකා විස්තර කර දෙයි. අංක එකේ කාරණාව වන්නේ පියාට අයත් වී ඔහුගේ නම කීර්තිමත් කර, සම්පූර්ණයෙන්ම පිවිතුරු වීමය. ඔබ සම්පූර්ණයෙන්ම මිහිරි ද විය යුතුයි. මෙය දේවමය ඥානයයි. දෙවියන් මෙතැන අසුන් ගෙන අපට උගන්වනවා. ඔබ එම උසස්ම- උසස් පියාව සිහි කළ යුතුයි. ඔබ ජීවයක් බව සැළකීමට ගත වන්නේ තත්පරයකි. ඔබ සාම දේශයේ වැසියන් බවත්, තම කොටස් රඟ පෑමට මෙහි පැමිණෙන බවත් ඔය ජීවයන්ට වැටහෙනවා. ජීව අඛණ්ඩව උපත් සහ පුනරුත්පත්ති ලබනවා. අප දැන් අංක පිළිවෙලට අපගේ උපත් 84හි කොටස් අවසන් කර තිබේ. ඔබ මෙම අධ්‍යයනය මෙන්ම, මෙම කොටස ද වටහා ගත යුතුයි. නාටකයේ රහස් ද ඔබගේ බුද්ධියේ තිබේ. මෙය ඔබගේ අවසන් උපත බවත්, මෙම අවසන් උපතේදී ඔබට පියා මුණගැසී ඇති බවත් ඔබ දන්නවා. ඔබගේ උපත් 84 අවසන් වන විට පැරණි ලෝකය පරිවර්ථනය වනවා. ඔබ මෙම අසීමිත නාටකයත්, උපත් 84ත් මෙම අධ්‍යයනය ගැනත් දන්නවා. උපත් 84 ගැනීමෙන් අනතුරුව, ඔබ දැන් අවසානය කරා ළඟා වී සිටිනවා. ඔබ දැන් ඉගෙන ගන්නා අතර, ඉන්පසුව අලුත් ලෝකයට යයි. අලුත් අය දිගින් දිගටම පැමිණෙනවා ඔවුන් දිගින් දිගටම එක් දෙයක් හෝ තව දෙයක් ගැන විශ්වාස කරයි. සමහරු මෙම ඉගෙනුමෙහි නිරත වනවා. ඔවුන් පිවිතුරු සහ සතෝප්‍රධාන් වන බව, ඔවුන්ගේ බුද්ධියේ තිබේ. පිවිතුරු වීමෙන් අපි අඛණ්ඩව වර්ධනය වෙයි. බාබා විස්තර කර ඇත්තේ ඔබ වැඩියෙන් සිහිපත් කිරීමේ සිටින තරමට, ඒ අනුව ඔය ජීව පිවිතුරු වෙයි. ඔය දරුවන්ගේ බුද්ධියේ මුළු නාටකයම තිබේ. ඔබ මේ ලෝකයේ

සෑම දෙයක්ම දමා, මෙහි පැමිණ ඇති බවත් ඔබ දන්නවා. ඔය ඇස් දෙකෙන් පෙනෙන කිසිවක් දෙස ඔබ නොබැලිය යුතුයි සෑම දෙයක්ම අවසන් වීමටයි යන්නේ. මෙය දැන් ඔබගේ අවසන් උපතයි. වෙන කිසිවෙක් මෙම අසීමිත නාටකය ගැන නොදනී. ඔබ දැන් මුළු චක්‍රයම දන්නවා. පියා දැන් පැමිණ ඇත්තේ ඔබව තමෝප්‍රධාන් බවින් සතෝප්‍රධාන් කිරීමටයි. එම විභාගය පැවැත්වෙන්නේ මාස 12කට පසුවයි. ඔබගේ සිහිපත් කිරීමේ වන්දනාව තවමත් අවසන් වී නොමැත. ඔබ බොහෝ දේ සිහි කරයි. මෙම සිහිපත් කිරීම ස්ථිර වූ විට, ඔබ වෙන කිසිවක් සිහි නොකරනු ඇත. ඔය ජීව පැමිණියේ අශාරීරිකවයි, ඔබ ආපසු යා යුත්තේ ද අශාරීරිකවයි. මෙම මුළු ලොවෙහි සෑම මනුෂ්‍යයෙකුගේම කොටස ඔබ දන්නවා. බොහෝ මනුෂ්‍යයින් සිටින අතර, ඔවුන්ගේ සංඛ්‍යාව එන්න එන්නම වැඩිවනවා. දැන් මිලියන ගණනක් සිටිනවා. ස්වර්ණමය යුගයේ ඇත්තේ අප ටික දෙනෙක් පමණයි. උපත් සහ පුනරුත්පත්ති ගැනීමේදී, විවිධ අතු රිකිලි වල නිකායන් සහ ඇදහිලි වැඩෙමින්, ගස බොහෝ විශාල වී තිබේ. ආදි සනාතන දෙවි දේවතා ධර්මය දැන් අතුරුදහන්වී ගොසින්ය. අපි දේවතා ධර්මයට අයත්ව සිටි විට, අප සතෝප්‍රධාන් විය. එම ධර්මය දැන් තමෝප්‍රධාන් වී ඇති නමුත් එය නැවතත් සතෝප්‍රධාන් වෙයි. තවද, අප අධ්‍යයනය කරමින් සිටින්නේ එය බවට පත් වීමටයි. ඔබ වැඩියෙන් අධ්‍යයනය කර, අන් අයට උගන්වන තරමට, ඔවුන්ට වැඩි යහපතක් සිදු වෙයි. ඔබ විස්තර කළ යුත්තේ බොහෝ සෙනෙහසින්ය. ඔබ අහස්යානා වලින් පත්‍රිකා හෙලිය යුතුයි. ඔවුන් උපතින් උපතට භක්තියේ යෙදී ඇති බව, ඔබ මෙම පත්‍රිකා වල විස්තර කළ යුතුයි. ගීතාව හැදෑරීමත් භක්තියේ යෙදීමය. ගීතාව හැදෑරීමෙන් කිසි කෙනෙක් මනුෂ්‍යයෙකුගෙන් දේවතාවක් වන්නේ නැත. නාටකයට අනුව, පියා පැමිණි පසු පමණයි ඔහු ඔබට සතෝප්‍රධාන් වීමේ ක්‍රමය පෙන්වා දෙන්නේ. ඉන්පසුව ඔබට සතෝප්‍රධාන් තත්ත්වයක් ලැබෙයි. මෙම අධ්‍යයනය තුළින් ඔබ එය බවට පත් වන බව ඔබට වැටහෙනවා. මෙය දෙවියන්ගේ පාඨශාලාවයි. දෙවියන් ඔබට උගන්වා, ඔබව සාමාන්‍ය මිනිසෙකුගෙන් නාරායන් බවට පත් කරයි. අප සතෝප්‍රධාන්ව සිටි විට, දෙව් ලොව තිබිණි. ඉන්පසුව අප තමෝප්‍රධාන් වූ විට, අපාය තිබේ. චක්‍රය භ්‍රමණය විය යුතුයි. පියා පැමිණ ඔබට මනුෂ්‍යයින්ගෙන් දේවතාවන් සහ ලෝක අධිපතියන් වීම සඳහා, උත්සාහ දැරීමට දිරි ගන්වයි. ඔබ පියා සිහි කර දිව්‍යමය ගුණධර්ම ධාරණය කළ යුතුයි. ඔබ සණ්ඩු සරුවල් නොකළ යුතුයි. දේවතාවන් කිසිම විටෙක රණ්ඩු නොකරයි. ඔබ, ඔවුන් මෙන් විය යුතුයි. සියලුම ගුණධර්ම වලින් පිරී සිටියේ ඔබයි, තවද ඔබ ශ්‍රීමත් අනුසාරයෙන් නැවත වතාවක් එසේ විය යුතුයි. ඔබ තමන්ගෙන්ම විමසිය යුතුයි මම කොතරම් දුරට සතුටින්ද? මට කොතරම් දුරකට විශ්වාසය තිබේද? මෙය දවස පුරාවටම සිහි කළ යුතුයි. කෙසේ වෙතත් මායා කෙසේද යත් ඇය ඔබට අමතක කරවනවා. පියා සමඟම, ලෝකයට සේවය කිරීම උදෙසා, ඔබ දෙවියන්ගේ උදව්කරුවන් බව ඔබට වැටහෙනවා. පෙර ඔබ සීමිත ඉගෙනුම් කළ අතර, ඔබ දැන් අසීමිත පියා සමඟ අසීමිත අධ්‍යයනය හදාරනවා. එයට නියමිත වූ කාලයේදී අත්හැරෙන, පැරණි ශරීරයකි මෙය එය අකල් මරණයකදී අතහැරිය නොහැක අප මෙම ශරීර සතුටින් අත්හළ යුතුයි. අප මෙම අපිරිසිඳු ශරීර අත්හැර, පැරණි ලෝකය ද අත්හැර ආපසු යනවා. විශිෂ්ඨ උත්සවයක් පැවැත්වෙන විට, මිනිසුන් සතුටින් අලුත් ඇඳුම් ඇඳ ගනී. ඔබ දන්නවා නව ලෝකයේදී ඔබට නව ශරීර ලැබෙන බව. අපට ඇත්තේ පිවිතුරු වීමේ සහ අන් සියලුම කණස්සලු වලින් නිදහස් වීමේ එක් අපේක්ෂාවයි. මේ සෑම දෙයක්ම අවසන් වීමටයි යන්නේ, එබැවින් කරදර වන්නේ කුමකටද? ඔබ භක්ති මාර්ගයේ චක්‍රයෙන් භාගයක්ම කරදර වනවා. දැන් ඉතිරිව ඇත්තේ ඉතාමත්ම සුළු කාලයක් පමණයි. පිවිතුරු වීමට කුඩා කනස්සලු බවක් තිබේ. ඉන්පසුව එකදු කරදරයක් වත් නොතිබෙයි. මෙය සතුට සහ දුක ගැන නාටකයකි. ස්වර්ණමය යුගයේ සතුට තිබෙන අතර කලි යුගයේ දුක තිබේ. ඔබට ඔවුන්ගෙන් විමසිය හැකි බව බාබා විස්තර කර තිබේ ඔබ ස්වර්ණමය යුග, සතුටු දේශයේ වැසියෙක්ද, කලි යුග දුක් දේශයේ වැසියෙක්ද? ඔබ මෙම අලුත් දේවල් කියා දෙයි. නිසැකයෙන්ම මෙසේ කියයි ඔබ දැන් දුක් දේශයේ වැසියෙකි. මනුෂ්‍යයින්ට, ඔවුන් කොහි වැසියන්ද කියා ඔවුන්ටම වැටහෙන අන්දමින්, මෙය ඉතාමත් සෙනෙහසින් විමසිය යුතුයි. ඔබට ප්‍රශ්න ඇසීමේ ඉතා හොඳ ආකාරයක් ඇති බව ඔවුන් කියාවි. ඔවුන් කොතරම් වැදගත් හෝ ධනවත් වුවද, ඔවුන් අපායේ වැසියන්ය. නව ලෝකයට ස්වර්ණමය යුගය යැයි කියයි. මෙම පැරණි ලෝකය දැන් කලි යුගයයි. මෙම ප්‍රශ්නය ඉතාමත්ම හොඳයි. ඉනිමගේ පිංතූරයේද මෙය පැහැදිලිය. ඔබ ඔවුන් ගෙන් මෙසේ විමසිය යුතුයි ඔබ සිටින්නේ සතුටු දේශයේද, ශෝක දේශයේද? මෙය දිව්‍යලෝකයද, අපායද? ඔබ දේවතාවක්ද, රාක්ෂකයෙක්ද? නිසැකයෙන්ම ස්වර්ණමය යුගයට දේවතා ලෝකය යැයි කියයි. කලි යුගයට කියන්නේ අපාය, රාක්ෂක ලෝකය කියාය. එබැවින් ඔබ ඔවුන්ගෙන් විමසිය යුතුයි ඔබ දිව්‍යලෝකයේ, දේවතා ලෝකයේ වැසියන්ද, එසේ නොමැති නම් කලි යුගයේ, රාක්ෂක ලෝකයේ වැසියන්ද? ඔබ කොතරම් ධනවත් වුවද, ඔබ වාසය කරන්නේ කොහිද? ඔබට දැන් මෙම ඥානය තිබේ. පෙර ඔබ මෙම දේවල් ගැන සිතුවේ වත් නැත. ඔබ දැන් සංගම යුගයේ සිටින

බව ඔබට වැටහෙන්නේ දැන්ය. කලි යුගයේ සිටින අය අපායේ අපවිත්‍ර වැසියන් වන අතර, ඔවුන් නැවත වතාවක් පිවිතුරු විය යුතුයි. මේ නිසයි ඔවුන් අඬගසන්නේ ඕ පාරිශුද්ධකරුවාණෙනි පැමිණෙන්න! පැමිණ අපව පිවිතුරු කරන්න! ඔබ මෙයත් විස්තර කළ යුතුයි. ඔබ වෙතට බොහෝ මිනිසුන් පැමිණියද, අතලොස්සයි මතු වන්නේ. මම කුමක්ද, මම කවුද, මම උගන්වන දේ කුමක්ද - ටික දෙනයි මෙය වටහා ගෙන අනුගමනය කරන්නේ. ඔබ ප්‍රදර්ශන ආදිය උදැසනින්ම වට පිටාවට රැගෙන යන විට, මෙම අධ්‍යයනය තුළින් අපි දිව්‍යලෝකයේ වැසියන් වන බව පෙන්විය යුතුයි. මෙම චක්‍රය, ස්වරණමය, රිදී, තඹ සහ කලි යුග තුළින් අඛණ්ඩව බ්‍රමණය වෙයි. මුළු චක්‍රයද ඔබගේ බුද්ධිය තුළ තිබේ. ඔබ නැවත වතාවක් සාම දේශයේ සහ සතුටු දේශයේ වැසියන් බවට පත් වනවා. ස්වර්ණමය යුගයේ දුක පිළිබඳ සඳහනක් නොමැත. ඔබ හොඳින් ඉගෙන නොගන්නේ නම්, ඔබට අඩු තත්ත්වයක් හිමි වෙයි. මෙය සාමාන්‍ය දෙයකි. එබැවින් මෙම අසීමිත අධ්‍යයනය හදාරා අසීමිත උරුමයක් හිමි කරගන්න. තමන් ජීවයක් යැයි සලකා, අසීමිත පියාව සිහිපත් කරන්න. එපමණයි. බාබා ඉතාමත්ම මිහිරිය. ඔහුගේ උපදෙස් වන්නේ ඔබගේම ශරීරය ඇතුළුව, සියලුම ශාරීරික බන්දන අවසන් කරන්න. ජීවය අවිනාශිය. එක් මොහොතකදී ඔබ ශරීරයක් ගන්නවා, ඊළඟ මොහොතේදී ඔබ එය අත්හරිනවා එයට කාලය ගත නොවෙයි. මෙකල, දවසින් දවස සෑම කෙනාම අඛණ්ඩව තමෝප්‍රධාන් වනවා. අප සතෝප්‍රධාන්ව සිටි විට, අපට දීර්ඝායුෂ තිබූ අතර, අප ඉතාම ටික දෙනයි සිටියේ. වෙනත් ආගමක් නොතිබිණි. ඔබ දැන් දරන උත්සාහයේ පදනමට අනුව, ඔබගේ ආයුෂ දීර්ඝ වෙයි. ඔබ වැඩියෙන් සිහිපත් කිරීමේ සිටික තරමට, ඔබගේ ආයුෂ වැඩියෙන් දික් වෙයි. ඔබ සතෝප්‍රධාන් වූ විට, ඔබගේ ආයුෂ බොහෝ දීර්ඝ විය. ඉන්පසුව ඔබ දිගින් දිගටම පහළට එත්ම, ඔබගේ ආයුෂ කෙටි විය. ඔබ රජෝ තත්ත්වයට ඇතුළු වූ විට ආයුෂ කෙටි විය. ඔබ තමෝ තත්ත්වයට ඇතුළු වූ විට එය තවත් කෙටි විය. බාල්දී පිරී, නැවතත් හිස් වන, වතුර රෝදයක නිදසුන තිබේ. ඉතිං මෙය අසීමිත ජල රෝදයකි. ඔබ දැන් පිරෙමින් සිටිනවා. ඔබ සම්පූර්ණයෙන්ම පිරුණු විට, ඉන්පසුව ක්‍රම ක්‍රමයෙන් හිස් වීමට පටන් ගනී. මෙය බැටරියකටද උපමා කළ හැක. අප සතෝප්‍රධාන් වීමෙන් අනතුරුව, ආපසු ගොස් උපත් 84ක් ගනී. චක්‍රයෙන් භාගයකට පසුව රාවණ් රාජධානිය ආරම්භ වෙයි. රාවණ්ගේ රාජධානියේ සෑම කෙනෙක්ම අපායේ වැසියන්ය. පසුව එන අය පැමිණෙන්නේ අපායටයි. පළමුවෙන්ම ඔබ යන්නේ දිව්‍යලෝකයටයි. ඔබට භක්තියේ ඵලය පියාගෙන් ලැබෙයි. මෙය වටහාගත හැක මෙම කෙනා බොහෝ භක්තියේ යෙදී තිබේ, මේ නිසයි ඔහු මෙම ඥානය ලබා ගන්නේ. පියා ඔබට මේ සියලු රහස් විස්තර කර දෙනවා. ඔබ ඉන්පසුව ඒවා වෙන අයට විස්තර කළ යුතුයි. මනුෂ්‍යයින් බොහෝ විවිධ වර්ගයේ පාපයන් සිදු කර තිබේ. පියා දැන් පැමිණ ඔබට ඥානය ලබා දෙනවා. පියා පැමිණෙන විට පමණයි ඔහු ඔබට උගන්වන්නේ. ඒ මුළු කාලයේම ඔබ මෙය දැන සිටියේ නැත ඔබ අඛණ්ඩව පාපකාරී ජීවයන් බවට පත් විය. ඔය ජීවයන් පිවිතුරු සහ පුණ්‍යවන්ත ජීවයන් වන්නේ කෙසේද, ඉන්පසුව පාපකාරී ජීවයන් වන්නේ කෙසේද? ස්වර්ණමය යුගයේ වැසියන් කවුරුන්ද, අපායේ වැසියන් කවුරුන්ද? ඔබ මේ කිසි දෙයක් දැන සිටියේ නැත. පියා දැන් විස්තර කර තිබේ. පියාට දැල්ල කියාද කියයි. ඔහුට ආලෝකය මෙන්ම ශක්තිය ද තිබේ. ඔබට ආලෝකය ඇති විට, එනම්, ඔබ අවදි වන විට, ඔබට ශක්තිය ලැබෙනවා. ඔබගේ ආයුෂ ද දික් වනවා. ඔබට එහි අකල් මරණ පැමිණිය නොහැක. ඔබ සතුටින් එක් ශරීරයක් අත්හැර තවෙකක් ගනී. දුක පිළිබඳ ප්‍රශ්නයක් නොමැත. එය ක්‍රීඩාවක් මෙනි. (සර්පයාගේ උදාහරණය තිබේ.) ඔබ ස්වර්ණමය යුගයේ සිට, කලි යුගය දක්වා ඔබගේ කොටස් රඟපා තිබේ. මෙය දැන් ඔබගේ බුද්ධිය තුළ පතිත වී තිබේ. බාබා ඔබගේ පියා, ගුරුවරයා සහ සත්ගුරුය. ඔබ දරන උත්සාහයට අනුකූලව අංක පිලිවෙලට මෙය දන්නේ ඔය දරුවන් පමණයි. ඔබ පුනරුත්පත්තිය මෙන්ම ඔබ උපත් කීයක් ගන්නවාද කියාද තේරුම් ගෙන තිබේ. බ්‍රාහ්මණ කෙනෙක් ලෙස ඔබ උපත් කීයක් ගන්නවාද? (එක් උපතක්). සමහරු දෙකක් හෝ, තුනක්ද ගන්නවා. නිදසුනක් වශයෙන් කෙනෙක් ඔහුගේ ශරීරය අත්හළ විට, ඔහු බ්‍රාහ්මණ සංස්කාර ඔහුත් සමඟ රැගෙන යනවා. බ්‍රාහ්මණවරයෙකුගේ සංස්කාර තිබෙන බැවින්, ඔහු නැවත වතාවක් සැබෑ බ්‍රාහ්මණ වංශයට පැමිණෙනවා. බ්‍රාහ්මණ ජීවයන්ගේ වංශය, දිගින් දිගටම වැඩිවෙයි. බ්‍රාහ්මණ වංශයට අයත් වීමේ සංස්කාර ඔවුන් උසුලාගෙන යනවා. ඔවුන්ට පියවීමට කර්ම ගිණුම් තිබේ නම්, උපත් දෙකක් හෝ තුනක් ගැනීමට පුළුවන. ඔවුන් ශරීර අත්හැර වෙනත් ඒවා ගනී. ජීවය, බ්‍රාහ්මණ වංශයේ සිට දේවතා වංශයට යයි. එය ශරීරය පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. ඔබ දැන් අයත් වන්නේ පියාටයි. ඔබ දෙවියන්ගේ දරුවන් මෙන්ම, ප්‍රජාපිතා බ්‍රහ්මාගේ ද දරුවන්ය. ඔබට වෙනත් ඥාතිකම් නොමැත. අසීමිත පියාට අයත් වීම සුළු දෙයක් නොවෙයි. ඔබ සතුටු දේශයේ අධිපතියන් බවට පත් වනවා. ඔබ ශ්‍රේෂ්ඨ පියාව හඳුනාගෙන තිබෙනවා පමණයි, එබැවින් ඔබගේ ඔරුව එගොඩට යයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කාලයක් නැති වී සිට දැන් හමු වුණු ඔය දරුවන්ව ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඔබගෙන්ම විමසන්න 1. මම කොතරම් දුරට සතුටින් සිටිනවාද? 2. මම සියලුම දිව්‍යමය ගුණධර්ම වලින් පිරිපුන්ව සිටි බවත්, ශ්‍රීමත් අනුසාරයෙන් මම නැවතත් එසේ විය යුතුය, යන විශ්වාසය මට කොතෙක් දුරට තිබේද? 3. මම කොතෙක් දුරට සතෝප්‍රධාන් වී තිබේද? දිවා රාත්‍රියේ පිවිතුරු, සතෝප්‍රධාන් වීමේ සැලකිලිමත් බව මට තිබේද?
2. අසීමිත පියා සමඟින් ඔබ ලෝකයට සේවය කළ යුතුයි. මෙම අසීමිත අධ්‍යයනය හදාරා, අන් අයටද උගන්වන්න. පියාගේ සිහිපත් කිරීම තුළින්, ශරීරයේ සහ ශාරීරික නෑදෑකම් වල බන්දන අවසන් කරන්න.

**වරදානය:** ඔබ සේවය කිරීමෙන් ලබන සැලකිල්ල සහ ගෞරවය නම් වූ නොඉදුණු ඵල අතහැර නිරතුරුව සතුටු හදවතකින් යුක්තව අහංකාරයෙන් ද නිදහස් කෙනෙක් වේවා.

රාජකීය ස්වරූපයේ අශාවන් වන්නේ, නම්බුව, සැලකිල්ල හා ගෞරවයයි. නම්බුව සඳහා සේවය කරන අය තාවකාලිකව නමක් උපයා ගත්තත් එම නම් පසුපසට ගොස් උසස් තත්ත්වයක් ලැබීමට අවහිර වන්නේ එය නොඉදුණු ඵල භුක්ති විඳීමක් වන හෙයිනි. ඇතැම් දරුවන්, සේවය නම් වූ විෂයෙන් ඔවුන්ට සැලකිල්ල ලැබිය යුතු යැයි සිතුවත් එය සැලකිල්ල නොව අහංකාරයයි. අහංකාරය ඇති තැන සතුට නැති වන අතර මේ නිසයි ඔබ අහංකාරයෙන් මිදී නිරතුරු සතුට අත්විඳිය යුත්තේ.

**පාඨය:** දෙවියන්ගේ සෙනෙහස වූ සතුට නැමති ඔන්චිල්ලාව පදින්න, එවිට දුක් රැළි නොපැමිණෙනු ඇත.

***** ඕම ශාන්ති *****

.

**බ්‍රහ්ම පියාට සමාන වීම සඳහා විශේෂ උත්සාහයන්.**

අංක එක ලද බ්‍රහ්මා ජීවාත්ම සත්තාව සමඟම, ඔබ සැම ද සුර දූතයන් වෙමින් සූක්ෂම කලාපයට ගොස් ඉක්බිතිව පරම්දාම් යා යුතු අතර ඒ සඳහා චිත්ත සමාධිය වෙත අවධානය යොමු කොට සිත ඔබේ අණ යටතට ගත යුතුයි. හැම අත්දැකීමක්ම අසභාය කරගෙන, ඔබේ ආකල්පය සහ දැක්මත් ක්‍රියාත් අසභාය කර ගන්න. ඔබ තුළ සුර ධූත තත්ත්වය අත්විඳිමින් අන් අයට ද එම අත්දැකීම ලබා දෙන්න.